# හැඳින්වීම

ගිහිසැප සම්පත් හැරදමා සසරින් එතෙර වීමේ අරමුණ පෙරදැරිව පැවිදි භාවය ලබා ගුණ දහම් පූරණය කරමින් වෙසෙන භික්ෂූන් වහන්සේ ගිලන් වූ කළ පිළිසරණක් නොමැතිව දැඩි දුෂ්කරතාවයනට මුහුණ පෑ අවස්ථා පිළිබඳව ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා දිවයිනේ ඈත ගම් දනව්වලට වැඩි අවස්ථාවලදී  මා ලද අත්දැකීම් මත, ගිලන් භික්ෂු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ අවශ්‍යතාව මා සිත කුලුගැන් වූ අතර, එකී සිහිනය යතාර්ථයක් බවට පත් වූ අවස්ථාව ලෙස ශීල සුව අරණ ගිලන් භික්ෂු මධ්‍යස්ථානය හැඳින්විය හැකිය.

ගිලන් භික්ෂූන් වහන්සේ වෙනුවෙන් බටහිර හා ආයුර්වේද ප්‍රතිකාර සහිතව මෙන්ම වෛද්‍ය හෙද, උපස්ථායක කාර්ය මණ්ඩලයකින් හා ඖෂධ මෙන්ම භෞතචිකිත්සක සේවාව වැනි සියලුම රෝහල් අංගෝපාංගයන්ගෙන් සමන්විත රෝහලක් බවට ශීල සුව අරණ රැගෙන ඒමට හැකිවීම මා ලද ජයග්‍රහණයකි. අද දින වනවිට මෙය දිවයිනේ ප්‍රමුඛතම ගිලන් භික්ෂු උපස්ථාන මධ්‍යස්ථානයක් බවට පත්ව ඇත.

ශීල සුව අරණ වාසී ගිලන් භික්ෂූන් වහන්සේගේ කායික සෞඛ්‍යය සුරකින අතර, උන් වහන්සේගේ මානසික සුවය උදෙසා සහ ආශිර්වාදය පතා බුදු සසුනේ නීරෝගී භක්ෂූන් වහන්සේ අතර අග තැන්පත් බක්කුල මහ රහතන් වහන්සේගේ නාමයෙන් බක්කුල මහා සෑය ඉදි කිරීමට හැකි වීම ගිලානෝපස්ථානය වඩාත් අර්ථ ගැන්වූ අවස්ථාවක් ලෙස දකිමි. අද වන විට ශිල සුව අරණ හා බක්කුල මහා සෑය සමස්ත ශ්‍රී ලංකා  වාසීන් තුළ මෙන්ම දේශ දේශාන්තරයන්හි පතළ ප්‍රධාන පෙළේ බෞද්ධ පුණ්‍ය භූමියක් ලෙස සංවර්ධනය කිරීමට හැකි වීමද අපගේ චිත්ත ප්‍රසාදයට හේතුවකි.

එමෙන්ම මෙම ව්‍යාපෘතියට සමගාමීව අසරණයින්ට නිවාස තනා දීම, දුෂ්කරතා වලින් පීඩා විඳින බෞද්ධ විහාරස්ථාන සඳහා වැසිකිළි කැසිකිළි පහසුකම් ලබා දීම, වෙහෙර විහාර ඉදි කිරීම, විවිධ ආබාධ තත්වයන්ට මුහුණ පෑ අසරණ ජනතාව වෙනුවෙන් රෝද පුටු දහස් ගණනක් පරිත්‍යාග කිරීම, සිසු දරුවන් වෙනුවෙන් පාසල් පොත් පත් උපකරණ ලබා දීම, දුෂ්කර පාසල්වලට උදව් උපකාර කිරීම, ඈත ගම්

දනව්වල ජීවත්වන අසරණ ජනතාවට ආහාර බඩු බාහිරාදීය ලබා දීම, රෝගීන් සඳහා සැත්කම් හා විවිධ ප්‍රතිකාර සඳහා මූල්‍ය හා භෞතික ආධාර පරිත්‍යාග කිරීම, මරණයට කැප වූ සතුන්ට අභය දානය සැලසීම වැනි අනේක විධ පිංකම් රැසක් සිදු කිරීමට හැකි වීමද විශේෂය.

මේ සැම පුණ්‍ය ක්‍රියාවක් සිදු කිරීම සඳහා මෙන්ම ශීල සුව අරණ හා බක්කුල මහා සෑය ගොඩනැගීම සඳහා ශ්‍රී ලංකාවාසී හා විදේශවල වෙසෙන අපගේ සැදැහැවත් දායක භවතුන්ගේ ආධාර උපකාර මා පසු පස සිට ඉදිරියට මා මෙහෙය වූ මහා බලවේගයක් බව මෙහිදී මා සිහිපත් කරන්නේ පුණ්‍යානුමෝදනා පෙරදැරිව මහත් අභිමානයෙනි. ශීල සුව අරණ තවදුරටත් සංවර්ධනය කරමින් ශාසනයේ චිරස්ථිතිය උදෙසා තිරසාර ලෙස අනාගතයට දායක කරන්නට පින්වත් ඔබ සියලු දෙනා ඉදිරියට ද මා හට ශක්තියක් වනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමි.

ශීල සුව අරණ හා බක්කුල මහා සෑය පිළිබඳව තොරතුරු දැන ගැනීමේ අභිලාෂයෙන් මෙන්ම මේ සඳහා සැදැහැවත් ජනතාවට දායක විය හැක්කේ කවර ලෙසකින්ද යන්න දිනපතා මෙහි පැමිණෙන සැදැහැවත් ජනයා නගන පැනයකි. මෙම කුඩා කෘතිය මගින් යම්තාක් දුරකට එම පැනයට පිළිතුරක් සැපයීමට හැකි වේ යැයි මම විශ්වාස කරමි.

"යෝ ගිලානං උපට්ඨෙයිය සෝ මං උපට්ඨාති"

සියලු සත්වයෝ නිදුක් වෙත්වා...! නීරෝගී වෙත්වා...! සුවපත් වෙත්වා...!

තෙරුවන් සරණයි !

මෙයට,
පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප හිමි
ශීල සුව අරණ, බක්කුල මහා සෑය නිර්මාතෘ හා ප්‍රධාන අනුශාසක
අක්කර 04, වැලිපත, කඳන, හොරණ
2023 අප්‍රියෙල් 05 වැනි දින
බක් මස පුරපසළොස්වක දිනදීය.

# “යෝ ගිලානං උපට්ඨෙයිය සෝ මං උපට්ඨාති”

“බුදුවරයෙකුට උපස්ථාන කලා සේ පිං රැස්වන ගිලනුන් හට සිදු කල හැකි ගිලානෝපස්ථාන මහා පින”

මේ බියකරු සසර කතරෙන් මිදී ලොව්තුරු නිවන් සුව පතා පෙරුම් පුරමින් සසර යන ශ්‍රාවකයා අල්ප ආබාධ ඇතිව ඉපදීමට ද, බක්කුල මහරහතන් වහන්සේ මෙන් නීරෝගීව උතුම් නිවන් සුව විඳීමට ද බොහෝ දෙනෙකු ප්‍රාර්ථනා කරයි.

නිරෝගී සම්පත්තිය ප්‍රාර්ථනාවකින් පමණක් ලැබිය නොහැක. ඒ පිණිස සසර ගිලානුපස්ථාන පින් දහම් සිදුකොට ප්‍රායෝගිකව පින් රැස්කල යුතුමය. යහපත් කර්මයන්ගේ විපාක ලෙසම යහපත් ප්‍රතිඵල තමන් කරා සසර ලැබෙන්නේය.

දිනක් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර කූටාගාර ශාලාවේ වැඩ සිටියදී ගිලන් භික්ෂූන් වැඩ සිටින ගිලන් හල කරා වැඩි සේක. එහි සිටි ගිලන් වූ දුබල භික්ෂුවක දැක ඒ අසල පනවන ලද ආසනය මත වැඩ සිටි මහා කාරුණික බුදුරජාණන් වහන්සේ භික්ෂුව අමතා මහණෙනි, දුබල භික්ෂුවක් හට කරුණු පහකින් අනුග්‍රහ කරත් නම් ඒ ගිලන්

භික්ෂුව නොබෝ දිනයකින්ම සියලු කෙලෙසුන්ගෙන් මිදී උතුම් නිවනට පත් වන්නේය.

1. ගිලන්වූ භික්ෂුව කයේ අසුභය නුවනින් දකිමින් නිතරම වාසය කරයි.

2. භික්ෂුව ගන්නා ආහාරය පිලිකුල් වශයෙන් දකිමින් වාසය කළ යුතුය.

3. ගිලන් වූ භික්ෂුව සියලු ලෝකයන් කෙරෙහි අනභිරත සඤ්ඤාව (නොඇල්ම) ඇතිව වාසය කළ යුතුය.

4. ගිලන් වූ භික්ෂුව සියලු සංස්කාරයන්ගේ අනිත්‍ය දකිමින් වාසය කළ යුතුය.

5. ගිලන් වූ භික්ෂුව මනා සිහි නුවණින් යුතුව මරණ සතියෙන් වාසය කළ යුතුය.

මේ කරුණු පහ වඩන ගිලන් වූ දුබල භික්ෂුව නොබෝ දිනකින්ම අමා මහ නිවන අවබෝධ කරයි.

(ගිලාන සූත්‍රය අං.නි.)

## <u>ගිලන් උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග</u>

“මහණෙනි, කරුණු පහකින් සමන්විත ගිලන් උපස්ථායක තෙමේ ගිලනුන්හට උපස්ථාන කිරීමට සුදුසුය.”

1. ගිලන් පුද්ගලයාට අවශ්‍ය බෙහෙත් හොඳින් හඳුනාගෙන කලට වේලාවට ඖෂධ ලබාදීමට දක්ෂ වෙයි.

2. ගිලන් පුද්ගලයෙකු හට සුදුසු ආහාර පාන මෙන්ම නුසුදුසු දෑද හඳුනා ගෙන නුසුදුසු දෙය බැහැරකොට සුදුසු දෙයම සකස්කොට ලබා දේ.

3. ලාභ අපේක්ෂාවකින් තොරව මෛත්‍රී සිතින්ම ගිලනුන් හට උපස්ථාන කරයි.

4. ගිලන් රෝගියාගේ මල, මුත්‍රා.කෙල,වමනය ආදී දෑ බැහැර වීමේදී පිළිකුලක් නැතිවම මෛත්‍රී සිතෙන් උපස්ථාන කරයි.

5. සෑම විටකම ගිලන් පුද්ගලයා හට ධර්ම කථාවෙන් අනුග්‍රහ කරයි. ධර්මය සිහිකරවමින්, ධර්මය තුලම ගිලන් රෝගියාව සමාදන් කරයි.

(ගිලානුපට්ඨාන සූත්‍රය - අං.නි.)

**ගිලන් භික්ෂූන්හට බෙහෙත් (ඖෂධ) පූජා කිරීමේ ආනිසංස දහයක් බුදුරජාණන් වහන්සේ දක්වා ඇත.**

1. දීර්ඝායුෂ ලැබීම.
2. උපන් සෑම ආත්මයකදීම ශරීර ශක්තිය ලැබීම.
3. බලගතු ප්‍රඥාවක් ලැබීම.
4. ශරීරයේ වර්ණවත් පැහැපත් බවක් ඇතිව ඉපදීම.
5. සසර පරිවාර සම්පත්තිය ලැබීම.
6. බොහෝ සැප සම්පත් ලබන්නකු වීම.
7. නොයෙක් උවදුරු විපත්වලින් වැලකීම.
8. කුඹුරු ගොවිතැන් පාලු නොවී මනා භව භෝග සම්පත් සසර දී ලැබීම.
9. ලෝකයාගෙන් ගරු බුහුමන් ලැබීම.
10. අකාලයේ ප්‍රියයන්ගෙන් වෙන් නොවී සැපසේ ජීවිතය ගත කිරීමට ලැබීම.

## <u>විශාඛා මහා උපාසිකාවගේ ඉල්ලීම් අට</u>

දිනක් මේ බුදු සසුනේ අග්‍ර උපාසිකාව වූ විශාඛා මහෝපාසිකාව බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලීම් අටක් සඳහා අවසර ඉල්ලීය.

1. මා හට සැවැත් නුවරට ආගන්තුකව වඩින භික්ෂු සංඝයා හට ආගන්තුක දානය පූජා කිරීමට අවසර ලබාදිය යුතුය.

2. සැවැත්නුවර සිට චාරිකාවේ වැඩම කරන භික්ෂූන් හට ගමික දානය පූජා කිරීමට අවසර ලබා දිය යුතුය.

3. බුදුරජාණන් වහන්සේ කැඳ දානයේ ආනිශංස දහයක් දේශනා කොට ඇත. මට දිනපතා සැවැත්නුවර වාසී සියලු සංඝයාහට කැඳ දානය පූජා කිරීමට අවසර ලබා දිය යුතුය.

4. සැවැත් නුවර වැඩ වෙසෙන ගිලන් භික්ෂූන්හට දිනපතා බෙහෙත් පූජා කිරීමට අවසර ලබා දිය යුතුය.

5. ගිලන් භික්ෂූ හට ප්‍රත්‍ය ආහාර අප්‍රත්‍ය ආහාර පිළිබඳ වෙන වෙනම සොයා බලා ගිලන් භික්ෂූන් හට ගිලන් දානය දීමට මට ම අවස්ථාව ලබා දිය යුතුය.

6. ගිලන් භික්ෂූන් හට උපස්ථාන කරන උපස්ථායක භික්ෂූන්ටද දානය පූජා කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

7. සැවැත් නුවර වාසී සියලු සංඝයාහට වැසි සළු පූජා කිරීමට මට අවස්ථාව ලබා දිය යුතුය.

8. සැවැත්නුවර වාසී සියලු භික්ෂුණීන් හට වැසි සළු පූජා කිරීමට මට ම අවස්ථාව ලබා දිය යුතුය.

යනුවෙන් ඉල්ලීම් අටක් විශාඛා මහා උපාසිකාව ඉල්ලූවිට,

මහණෙනි, මගේ බුදුසසුන තුල වැඩ සිටින උපාසක, උපාසිකාවන් සියලු දෙනා මේ විශාඛාවම ආදර්ශයට ගෙන නිවනම අරමුණු කොට දන් පිංකම් කරත්වා යැයි බුදුරජාණන් වහන්සේ තුන්වරක් සාදු කාර දෙමින් ඒ ඉල්ලීම් අනුමත කළහ.

ගිලනුන්ට උපස්ථාන කිරීම බුදුවරයෙකුහට උපස්ථාන කළා වැනි යැයි පූතිගත්තතිස්ස හිමියන් අරහයා පැන නැගී සිදුවීමේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කළහ.

මහණෙනි, යම් ගිලන් වූ අයෙකු හට අවශ්‍ය ආහාර පාන සුදුසු පරිදි නොලැබේද? සුදුසු බෙහෙත් ද්‍රව්‍ය සුදුසු පරිදි නොලැබේද? ඉතා හොද උපස්ථායකයෙකු නොලැබේද? ඒ රෝගය සුවපත්ව නැගී සිටීම කිසි කලෙකත් නොවන්නේමය.

නමුත් මහණෙනි, යම් ගිලනෙකු හට සුදුසු ගිලන් ආහාර පාන සුදුසු පරිදි ලැබේද? සුදුසු ගිලන් බෙහෙත් නිසි කලට ලැබේද? සුදුසු ගිලන් උපස්ථායකයෙකු

ලැබේද? එපමණකින්ම ඒ රෝගයෙන් සුවපත්ව නැගී සිටිය හැකි වන්නේය.

මහණෙනි, කුඩා වූද, මහත් වූද, සියලු ඥාතීන් අතහැර නිවන් අවබෝධ කිරීමේ අදහසින් පැවිදිවූ නුඹලා අනුන්ගෙන් ලැබෙන සිවුපසයෙන්ම යැපෙන්නේය. නුඹලාට කවරෙකුගේ නම් පිහිටක්ද? ඒ නිසා යමෙකු ගිලන් වූ කල මෛත්‍රී සිතින් යුතුව ගිලන් උපස්ථානයේ යෙදිය යුතුය.

(අං.නි. 01)

## ශීල සුව අරණ

## ගිලන් භික්ෂු උපස්ථාන මධ්‍යස්ථානය

පූජනීය ගලිගමුවේ ඤාණදීප ස්වාමීන් වහන්සේගේ සංකල්පයක් මත උන්වහන්සේ විසින් අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව ආරම්භ කරන ලද ගිලන් භික්ෂු උපස්ථාන මධ්‍යස්ථානය වසර දහයක් පමණ කාලයක් තුල දෙස් විදෙස් සැදැහැවතුන්ගේ උදව් උපකාර මතින් ගිලන් භික්ෂූන් වහන්සේලා හතලිස් පස් නමකට පමණ නේවාසිකව ප්‍රතිකාර ලබාගත හැකි ආයුර්වේද සහ බටහිර ප්‍රතිකාර සිදු කෙරෙන රෝහලක් බදු පින්බිමක් බවට පත්ව ඇත.

හොරණ රත්නපුර පාරේ හොරණ නගරය පසුකොට සැතපුමක් පමණ රත්නපුර දෙසට ගමන් කොට දකුණට හැරී දික්හේනපුර පාරේ සැතපුම් දෙකක් පමණ ගියතැන මනරම් වෙල්යායක් මැදින් වමට පිහිටි මාවතේ මීටර පන්සීයක් පමණ ගියතැන ඉතා නිස්කලංක පරිසරයක "ශීල සුව අරණ" නම් ගිලන් භික්ෂු ආරාමය පිහිටා ඇත.

ගෞතම බුදු සසුන තුළ නිවන් අවබෝධ කොට සසර දුකින් මිදීමේ අදහසින් කුඩා වූද මහත් වූද ඥාතීන් හැරදමා ගිහි සැප සම්පත් අත්හැර පැවිදි බවට පත්වන භික්ෂූන් වහන්සේලා හට වයස් ගතව ගිලන් වූ කළ නොමිලේ සියලු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගනිමින් රෝගී තත්ත්වයන් සුවපත් කරගැනීම පිණිස කිසිදු නිකාය භේදයකින් තොරව මෙම ගිලන් භික්ෂු මධ්‍යස්ථානය තුලින් භික්ෂූන් වහන්සේලා හට උපකාර කෙරේ.

බොහෝවිට ආරණ්‍ය ගතව මිල මුදල් පරිහරණයෙන් වැළකී හුදකලාවේ පිණ්ඩපාතික ජීවිත ගතකරමින් සිටි සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලා ගිලන් වූ කළ කිසිදු හව් හරණක් නොමැතිව බෙහෙතක් ලබා ගැනීමට පවා මුදලක් නැතිව ඉතා අසරණව ජීවිතය සැදෑ සමය ගෙවනු අප දැක ඇත.

"ශීල සුව අරණ" ගිලන් භික්ෂු මධ්‍යස්ථානය තුළ ගිලන් භික්ෂූන් වහන්සේලා උදෙසා රෝගියෙකුට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම්වලින් යුතු ගිලන් කුටි

45 කින් සමන් විත නවීන පහසුකම්වලින් යුතු කුටි සංකීර්ණයක්, වෛද්‍ය කාමර, බටහිර ඖෂධ ෆාමසියක්, ආයුර්වේද ඖෂධ ෆාමසියක්, හදිසි අවස්ථාවක ඔක්සිජන් ලබා දෙමින් හදිසි වෛද්‍ය ප්‍රතිකාර ලබාදිය හැකි හදිසි ප්‍රතිකාර ඒකකයක් ආදී ගිලන් භික්ෂූන් වෙනුවෙන්ම මෙම පිංබිමේ අවශ්‍ය පහසුකම් රැසක් දැනටමත් ඉදිකොට අවසන්ය.

- දිනපතා විශේෂඥ වෛද්‍යවරුනගේ පරීක්ෂාව යටතේ බටහිර වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම.

- රෝහල්වල සේවය කොට ඇති, ඉතා දක්ෂ පළපුරුදු රෝහල් කාර්ය මණ්ඩලයක් යොදවා ගිලන් භික්ෂූන් හට උපස්ථාන කටයුතු සිදු කිරීම.

- ගිලන් භික්ෂූන් රෝහල් ගතකොට වැඩි දුර ප්‍රතිකාර ලබාදීම හෝ ශල්‍යකර්ම සිදුකිරීම් ආදී කටයුතුවලදී වැයවෙන වියදම් අප ගිලන් භික්ෂු ආයතනය විසින් සිදු කිරීම.

- ශීල සුව අරණ ගිලන් භික්ෂු මධ්‍යස්ථානය තුළ වැඩ වසන භික්ෂූන් වහන්සේලා අපවත් වූ අවස්ථාවේ දී ධර්මානුකූලව ආදාහන කටයුතු අප ආයතන වියදමින් සිදු කිරීම.

- ගිලන් භික්ෂූන් හට අවශ්‍ය ඖෂධ ලබා දීම, ගිලන් ආහාරපාන සකස් කිරීම, කැඳ වර්ග, ඖෂධීය බෙහෙත් වට්ටෝරු යටතේ ගිලන් ආහාර ශීල සුව අරණ තුළ දීම වෙන වෙනම සකස් කිරීමට සේවකයන් යෙදවීම.

- දිනපතා විෂබීජ නාශක යොදා ගිලන් කුටි වැසිකිලි ආදිය පිරිසිදු කිරීම, සිවුරු දිනපතා තම්බා සේදීම ආදී සනීපාරක්ෂක කටයුතු සඳහා සේවකයන් යෙදවීම.

- ගිලන් භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික දියුණුව පිණිස දිනපතා ධර්ම ශ්‍රවණ පහසුකම්, උදෑසන සහ සවස සිදු කෙරෙන බුද්ධ වන්දනා කටයුතු, ගිලන් භික්ෂූන් හට බුද්ධ දේශනා ඇසුරෙන් භාවනා කටයුතු කියාදීම ආදී ආධ්‍යාත්මික වැඩ පිළිවෙලක් පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප ස්වාමීන් වහන්සේගේ මග පෙන්වීම යටතේ සැලසුම් කොට ඇත.

## <u>ගිලන් භික්ෂු ප්‍රතිකාර කටයුතු සඳහා සැදැහැවත් ඔබේ දායකත්වය</u>

- සැදැහැති ඔබගේ ආධාර උපකාර මත ගිලන් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් නොමිලේ පවත්වාගෙන යන මෙම පිංබිමේ කටයුතු

පවත්වාගෙන යාම සඳහා මසකට ලක්ෂ තිහකට අධික වියදමක් දැරීමට සිදුව ඇත.

- අධික විදුලි බිල්පත් වියදම්, 40 කට අධික කාර්ය මණ්ඩලයක් වෙනුවෙන් ගිලන් උපස්ථාන දීමනා ගිලන් රථ වියදම්, රෝගී තත්ත්වයන් මත වෛද්‍යවරුන්ගේ අධීක්ෂණය මත සකසන පෝෂණීය ආහාර වට්ටෝරු, වෛද්‍ය පරීක්ෂණ, ශල්‍යකර්ම වියදම් ආදී දහසකුත් වියදම් මෙම පුණ්‍ය භූමියේ ප්‍රතිකාර ලබන විවිධ අසාධ්‍ය රෝගී තත්වයන් ගෙන් යුතු භික්ෂූන් වහන්සේලා හට සියලු වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙමින් උන්වහන්සේලා රැකබලා ගැනීම පිණිස දැරීමට සිදුව ඇත.

- වර්තමානයේ අප රටේ ඇතිව පවතින ආර්ථික අර්බුදය මත ආහාර, බෙහෙත් පමණක් නොව සෑම දෙයකම මිල ගණන් දෙතුන් ගුණයකින් ඉහළ ගොස් ඇත. මෙම වාතාවරණය තුළ ගිලන් භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් කිසිදු දේශපාලන අනුග්‍රහයක් නොමැතිව, රාජ්‍ය මුදල් හෝ වෙනත් රාජ්‍ය නොවන සංවිධානයක ආධාරයක් නොමැතිව හා අපගේ ධර්ම ප්‍රචාරක කටයුතු මතම ශ්‍රද්ධාව උපදවාගෙන මෙම පිං කටයුතු සඳහා තම ශක්ති පමණින් ආධාර උපකාර ලබාදෙන සැදැහැවතුන්ගේ ශක්තිය

මතින් මෙවන් පුණ්‍ය භූමි පවත්වාගෙන යෑම ඉතා අසීරු වී ඇත.

- මේ සඳහා දායකත්වය ලබා දෙනු කැමති සැදැහැවතුන් වෙනුවෙන් මාසික දායකත්වයක් හො එකවර යාවජීව සාමාජික දායකත්වයක් ලබා ගැනීම පිණිස උතුම් වැඩපිළිවෙලක් අප සැලසුම් කොට ඇත.

- මාසිකව අඛණ්ඩව සිදුකළ හැකි ශිල සුව අරණ මාසික සාමාජික මුදල රු.1000/=

- යාවජීව සාමාජික මුදලක් ලෙස එකවර ගෙවා ලබාගත හැකි ශීල සුව අරණ යාවජීව සාමාජිකත්ව මුදල රු.25000/=

- මීට අමතරව ශීල සුව අරණ පිංබිමේ වැඩ සිටින ගිලන් භික්ෂූන් වහන්සේලාගේ දිනක වියදම් ඔබගේ ජීවිතයේ විශේෂිත දිනයක් වෙන්කොට ගෙන දිනක දායකත්වයක් ලෙස ලබා ගත හැකිය.

## ශීල සුව අරණ දිනක දායකත්වය

- මෙම පිංබිමේ වැඩ සිටින සියලුම ගිලන් භික්ෂූන් වහන්සේලාගේ වෛද්‍ය පරීක්ෂණ වියදම්, ශල්‍යකර්ම, රෝහල්ගත කිරීම් ආදී වියදම්, ආයුර්වේද බටහිර ප්‍රතිකාර වියදම්, බෙහෙත්

වියදම්, වෛද්‍ය ප්‍රතිකාර වියදම්, රෝහල් කාර්ය මණ්ඩල ගිලන් උපස්ථාන ආදී සියලුම වියදම් මෙන්ම,

ශීල සුව අරණ පිංබිමේ විදුලිය, ජලය, දුරකථන, ගිලන් රථ වියදම් ආදී ගිලන් භික්ෂු පිංබිමේ මාසික නඩත්තු වියදමේ සාමාන්‍යක් ලෙස දිනක සම්පූර්ණ වියදම රු.30000/= වශයෙන් **"දිනක දායකත්වයක්"** ලෙස ඔබට භාරගත හැක.

ඒ සඳහා දායකත්වය දැක්වීමට කැමති පින්වතුන් වෙනුවෙන් පහත සඳහන් ගිණුම් වෙන්ව ඇත.

**සම්පත් බැංකුව - අතුරුගිරිය**

**ශීල සුව අරණ**

**0067 6000 0068**

**ලංකා බැංකුව - අගනුවර ශාඛාව**

**ශීල සුව අරණ**

**80074124**

ඇතැම් රටවල සැදැහැවතුන් හට ඉහත ගිණුම් වෙත ඔබේ මුදල් පරිත්‍යාග කිරීමට තාක්ෂණික අපහසුතා ඇත්නම් පහත ගිණුම් අංකයද භාවිතා කළ හැක.

| |
|---|
| **හැටන් නැෂනල් බැංකුව - අතුරුගිරිය ශාඛාව** |
| **ගලිගමුවේ ඥාණදීප හිමි** |
| **1540 2005 9835** |

## පිං කැමති ඔබට ගිලන් භික්ෂු පිංබිමේ දිනක දායකත්වය භාරගත හැක.

## එමෙන්ම

## බක්කුල මහා සෑය අභියස දිනපතා සිදුකෙරෙන ඖෂධ පූජා පිංකම.

මෙත්ත ගුත්ත හිමි සුමේධ බුදු රජුන්ට ගිතෙල් ඖෂධ පිදූ පිනින් අට වරක් සක් දෙවිඳු වූ බවත් පනස් එක් වරක් සක්විති රජකම ලැබූ බවත් එසේම සැම ජීවිතයක ම පාහේ අප්‍රමාණ භෝගසම්පත් ලැබ අවසානයේ ඒ පිනෙන් නිවන් අවබෝධය ද ලැබූ බව 403 වන අපදානයේ පෙන්වා ඇත.

ඖෂධ පූජාවන් සඳහා භාවිතා කරන සුවිශේෂී ඖෂධ වර්ග 108 ක් භාවිතා කරමින් ඖෂධ සකස් කොට, ඒ දින දායකත්වය දරණ පිංවතුන් ලවා බක්කුල මහා සෑය වෙනුවෙන් තැම්පත් කොට, දිවයිනේ චිර ප්‍රසිද්ධ ස්වාමීන් වහන්සේ නමක් වැඩම කරවා දිනපතා සිදුකරන පිංකම.

එම ඖෂධ පූජා පිංකම මෙත් TV නාලිකාව තුළින් සජීව වැඩසටහනක් ලෙස හෝ සුවිශේෂ දිනයක විකාශනය කෙරෙන වැඩසටහනක් ලෙස සැදැහැවතුන්ගේ අභිමතය පරිදි වෙන් කරවා ගත හැකිය.

බක්කුල මහරහතන් වහන්සේ සිහිකොට උන්වහන්සේගේ ශ්‍රී නාමයට මේ ලෝ තලයේ ඉදිවූ අසිරිමත් බක්කුල මහා සෑරදුන් අභිමුඛ අපමහා ශ්‍රාස්තෘවර භාග්‍යවත් සම්මා සම්බුද්ධ පියාණන් වහන්සේට 108ක් ඖෂධ ගිලන්පස ආදී නෙක පූජාවන් සිදු කල ඔබට සසර පුරා නිවන් දකින තෙක් නීරෝගී සුඛ විහරණය පිණිස අනන්ත නීරෝග ආශිර්වාදය සැලසේවා.

ඖෂධ පූජාවක දායකත්වය ලබාගැනීමට අමතන්න.

**034-2263646 / 011-2771717 / 076-3875693**

**077-1373646**